# ශ්‍රී ලංකාවේ විධිමත් පාසල් සඳහා පොදුවූ, 10-11 ශ්‍රේණිවල පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල, ගණිතය විෂය සඳහා ක්‍රියාත්මක කිරීමේ දී පවතින විවිධතා පිළිබඳ අධ්‍යනයක්.

(කොළඹ දිස්ත්‍රික්කයේ පාසල් ඇසුරෙනි)

**A study on the School Based Assessment system of the 10 and 11 grades of the formal schools of Sri Lanka in relation to the diversities on the subject Mathematics.**
**(Regarding Schools in Colombo District)**

කොළඹ විශ්වවිද්‍යාලයේ,
අධ්‍යාපන පීඨයේ,
අධ්‍යාපනපති උපාධිය (පූර්ණ කාලීන පාඨමාලාව) සඳහා
ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ කෘතිය.

UCLIB
561477

අජිත උදය වික්‍රමආරච්චි
**2004/M.Ed(FT)S/17**
ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා (සියනෑ අ.වි.පී.)
විද්‍යාවේදී උපාධි (කොළඹ වි.වි.)
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන) (කොළඹ වි.වි.)
ශ්‍රී. ලං. අ. ප. සේ.

561477

# අධ්‍යයනයේ සාරාංශය


යම් වැඩ පිළිවෙලක් මගින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබේ ද යන්න සොයා බැලීම එම වැඩ පිළිවෙලේ ම එක් අංගයකි. ඒ අනුව අධ්‍යාපනය සම්බන්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ද ශිෂ්‍යයාගේ සාධන මට්ටම සොයා බැලීම අනිවාර්ය බව අධ්‍යාපනඥයින් ගේ අදහසයි. සිසුන්ගේ අවසාන සාධන මට්ටමටත් වඩා ඔවුන් ඉගෙන ගන්නා දෙය පිළිබඳ ව ද ඉගෙන ගන්නා තරම පිළිබඳ ව ද සොයා බැලීම ඉතා වැදගත් වේ.

1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමෙත් අනතුරුව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ සොයා බැලීම සඳහා පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙලක් ආරම්භ කරන ලදී. 6-13 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් අතර ගැවසෙමින් ඔවුන්ගේ හැකියා පිළිබඳ ව සොයා බලමින් ඉදිරියට යාම සඳහා උදව් ලබා දීම මෙම වැඩ පිළිවෙලේ ප්‍රධාන පරමාර්ථය විය.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල පිළිබඳ පර්යේෂණ සිදු කරනු ලැබුවද, වැඩ පිළිවෙල ප්‍රායෝගික මට්ටමින් ක්‍රියාත්මක වන ආකාරයට පිළිබඳ කර ඇති පර්යේෂණ අල්පය. අවුරුදු විස්සකට ආසන්න කාලයක් පද්ධතියේ විවිධ භූමිකා නිරූපණය කර ඇති පර්යේෂකයාට පැහැදිලි වන්නේ පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල වසර දහයකට වැඩි කාලයක් පද්ධතියේ ක්‍රියාත්මක වුවද මේ වන විටත් ඒ සම්බන්ධව විවිධ ගැටලු පවතින බවයි. මේ සම්බන්ධව පන්ති කාමරයේ සිටින ගුරුවරයා මුහුණ පා ඇති ගැටලු පිළිබඳ සෙවිය යුතු වේ.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙලින් අපේක්ෂිත අරමුණු කෙතෙක් දුරට පන්ති කාමරයේ ඉටුවේදැයි සොයා බැලීම වැදගත් වේ. වැඩපිළිවෙලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ගුරුවරුන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ ව සොයා බැලිය යුතු වේ. පන්ති කාමරය තුළ ගුරුවරයා ගනු ලබන ක්‍රියාමාර්ග පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලිය තුළ යෝජිත වැඩ පිළිවෙළත් සමඟ කෙතෙක් දුරට ගැළපේදැයි සොයා බැලීම වැදගත් වේ. ඒ ඇසුරින් යෝජිත වැඩ පිළවෙළ සහ ක්‍රියාත්මක වන තත්ත්වය අතර පවතින සමානතා, අසමානතා හඳුනාගත හැකිවනු අතර එවැනි විෂමතා පැවතීමට හේතු අධ්‍යයනය කළ හැකි වේ. ඒ ඇසුරින් පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයෙන් බලාපොරොත්තු විණි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සිංහල මාධ්‍ය පාසල් 10 ක් මේ සඳහා තෝරා ගන්නා ලදී. තෝරා ගත් පාසල් අතර බාලක, බාලිකා සහ මිශ්‍ර ලෙස ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ඉගෙනුම ලබති. මෙම පාසල් කොළඹ, පිළියන්දල, හෝමාගම සහ ජයවර්ධනපුර යන කලාපවලට අයත් වේ.

නියැදියට අයත් පාසල් 10 අතරින් ගණිතය ඉගැන්වීම කරනු ලබන ගුරුවරුන් 40 ක් සහ ඒ එක් එක් ගුරුවරයා යටතේ ඉගෙනුම ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100 ක් ද එම පාසල්වල විදුහල්පතිවරුන් ද පර්යේෂණයට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා යොදා ගන්නා ලදී.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල සම්බන්ධව නියැදියට අයත් ගුරුවරුන් දක්වන අදහස් අනාවරණය කර ගැනීම ක්ෂේත්‍ර හතරක් ඔස්සේ සිදු කරන ලදී. ඇගයීම් සම්බන්ධ ගුරුවරුන්ගේ අදහස්, ඇගයීම් සම්බන්ධව පවතින අවබෝධය, ගණිතය විෂයට අදාළව කරනු ලබන ඇගයීම් ක්‍රියාකාරකම් හා ගුරුවරුන්ට මතුවී ඇති ගැටලු මෙහිදී අවධානය යොමු කරන ලදී.

පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් ලබා දී තිබුණ ද එම අරමුණු ඉටුවීම දුර්වල මට්ටමක පවතින බව අනාවරණය විය. මෙම ඇගයීම් කටයුතු පාසල තුළ ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරයි. එනම් නිමකල යුතු ඇගයීම් සංඛ්‍යාව පිළිබඳව පමණක් අවධානය යොමුකර කටයුතු කරයි.

අරමුණු රැසක් මුල් කර ගනිමින් පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ ද මෙම අරමුණු ඉටු වන අයුරින් පාසල තුළ ක්‍රියාත්මකවීමක් නොවන බව අනාවරණය විය. එමෙන්ම පොදු උපදෙස් මත ක්‍රියාත්මක වන වැඩපිළිවෙළක් වුවද ඒ ඒ පාසල් අතර සබඳතාවක් දක්නට නොමැති බව අනාවරණය විය. ඒ අනුව පාසල පදනම් කරගත් ඇගයීම් සම්බන්ධ මෙවැනි තොරතුරු රැසක් අනාවරණය කර ගැනීමට පර්යේෂකයාට හැකි විය.